සියලුම හිමිකම් ඇවිරිණි / All Right Reserved

# විද්‍යාරත්න විද්‍යායතන පිරිවෙන - හොරණ

## පළමු වාර පරීක්ෂණය - 2022

## 1st Term Test 2022 - August

| 11 ශ්‍රේණිය | ඉතිහාසය I | කාලය : පැය 1 යි. |
|---|---|---|

## I කොටස

■ ප්‍රශ්න 40 ටම පිළිතුරු සපයන්න. එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා කොටු කොළයේ සළකුණු කරන්න.

01. මහාවංශය ලියවී ඇත්තේ,
    1. ක්‍රි.ව. 4 වන සියවසයේදී ය.
    2. ක්‍රි.ව. 5 වන සියවසයේදී ය.
    3. ක්‍රි.පූ. 4 වන සියවසයේදී ය.
    4. ක්‍රි.පූ. 4 වන සියවසයේදී ය.

02. ඉතිහාසය හදාරණ අභිලේඛන සාධකයක් නොවන්නේ,
    1. සෙල්ලිපි
    2. කාසි
    3. දුනු රීතල
    4. පුවරු ලිපි

03. සාහිත්‍ය මූලාශ්‍ර වර්ගීකරණයට නොවැටෙන්නේ,
    1. ගද්‍ය
    2. පද්‍ය
    3. වංශකථා
    4. පුවරු ලිපි

04. ලක්දිව ඇති සෙල්ලිපි කිහිපයක් පහත දැක්වෙන අතර ඉන් පැරණිතම සෙල්ලිපිය කුමක්ද ?
    1. රජගල ලිපිය
    2. සොරබොර ලිපිය
    3. අඹගමුව ශිලා ලිපිය
    4. රුවන්වැලි සෑ පුවරු ලිපිය.

05. කාසි මූලාශ්‍රයක් ලෙස භාවිතා කිරීමේදී වැදගත් නොවන්නේ,
    1. එහි ඇති කැටයම්
    2. භාවිත කර ඇති ලෝහය
    3. කාසි රැගෙන ගිය පුද්ගලයන්
    4. විසිරී ඇති ප්‍රදේශ

06. ගමිකගේ කාර්යයක් නොවන්නේ කුමක්ද?
    1. කණ්ඩායම නිවැරදිව හසුරුවාලීම
    2. වැව නඩත්තු කිරීම
    3. රජුගේ බදු එකතු කිරීම
    4. ගමේ ආරවුල් විසඳීම

07. "අලකපය" මහරජ යනුවෙන් භාවිත කළේ,
    1. නිශ්ශංකමල්ල රජු
    2. පලමුවන කාශ්‍යප රජු
    3. කුටකණ්ණඅභය රජු
    4. මහසෙන් රජු

08. 'රජ' යන්නට මුල් ඓතිහාසික යුගයේදි දී ඇති අර්ථය වන්නේ
    1. සතුටු කරන්නා
    2. පරුමකගේ ප්‍රධානියා
    3. දෙවියන්ගේ නියෝජිතයා
    4. සහජීවනයේ නිර්මාතෘ

09. මහා වික්‍රමබාහු රජු පිළිබඳව තොරතුරු සඳහන් නොවන මූලාශ්‍රය කුමක්ද?

1. පනාකඩුව තඹ සන්නස
2. මහාවංශය
3. අඹගමුව සෙල් ලිපිය
4. වල්ලිපුරම් රන්පත

10. ක්‍රි.ව. 9 වන සියවස වන විට මෙරට බෞද්ධ විහාරවලට ඉඩම් ප්‍රදානය කිරීමේදී සම්බන්ධ වූ ආයතනය නම්,

1. වැඩිහිටි මණ්ඩලය
2. සභාව
3. ව්‍යවස්ථාදායකය
4. මහලේ කස්බා

11. ගැබිණි මව්වරුන්ට මාතෘ නිවාස තැනවූ රජු වන්නේ,

1. I වන උපතිස්ස රජු
2. I අග්බෝ රජු
3. I වන කාශ්‍යප රජු
4. I වන විජයබාහු රජු

12. ඔලගම් වශයෙන් අතීතයේ හඳුන්වා ඇත්තේ,

1. මියගිය අය වල දමූ ගම්
2. වැටකින් වෙන් නොකළ ගම්
3. අත්හැර දමූ ගම්
4. ගොවියන් විසූ ගම්

13. එල්ලංගාවකින් කෙරෙන ප්‍රධාන කාර්යයක් නම්,

1. වර්ෂාව නිසා ඇතිවන ගංවතුර පාලනය කිරීම
2. පොළවේ තෙතමනය පවත්වාගෙන යාම
3. මත්ස්‍යයන් බෝ කිරීම වැඩි කිරීම
4. ඇල මාර්ග සංරක්ෂණය වීම .

14. අතීතයේ සද්විහරික භික්ෂූන් යනුවෙන් හඳුන්වා ඇත්තේ,

1. නායකහිමිවරු
2. නිරෝගී භික්ෂූන්
3. ශ්‍රද්ධාව ඇති භික්ෂූන්
4. සමීපයේ වාසය කරන භික්ෂූන්

15. 'බිසෝකොටුව මගින් කෙරෙන ප්‍රධාන කාර්යය වන්නේ,

1. වැව් බැම්මට හානි නොවන සේ සොරොව්වෙන් ජලය පිට කිරීම
2. සොරොව්වේ ජලය පාලනය කිරීම
3. පිටවාන මගින් ඇතිවන හානිය වැළැක්වීම
4. ඉහත සඳහන් සියල්ලම.

16. අතිතයේදී බර මැනීමට භාවිතා නොකළ ඒකකය කුමක්ද?

1. අක
2. කරීස
3. ගුන්ජා
4. ධරණ

17. අතීතයේ සෙල්ලිපිවල කුඩීන් ලෙසට හඳුන්වා ඇත්තේ,

1. ප්‍රභූන්
2. ඇමතිවරු
3. ගොවියන්
4. මහජනතාව

18. රද්කොල් සම්දරු යනු,

1. රජුගේ සේවකයන්
2. රජ පවුලේ කාන්තාවන්
3. රජුගේ දරුවන්
4. රාජකිය නිලධාරීන්

19. ජලාශවල සිටින පක්ෂීන් මැරීම තහනම් කළ රජු,

1. නිශ්ශංකමල්ල රජු
2. පරාක්‍රමබාහු රජු
3. වසභ රජු
4. හතරවන මිහිඳු රජු

20. පොළොන්නරු රාජධානිය විනාශවීමට බල නොපානලද හේතුව කුමක්ද?

1. මාඝගේ ආක්‍රමණ
2. චන්ද්‍රභානුගේ ආක්‍රමණ
3. වසංගත රෝග
4. දුර්වල පාලනය

21. පියාගෙන් පුතාට රාජ්‍ය උරුමවීමේ සම්ප්‍රදායට අනුව රජවරු ඇතුලත් පිළිතුර තෝරන්න.

1. වසභ රජු, වංකනාසික තිස්ස රජු
2. පළමු කාශ්‍යප - මුගලන් රජු
3. විජය රජු - පණ්ඩුකාභය රජු
4. දේවානම්පියතිස්ස රජු - උත්තිය රජු

22. පහත කාර්යයන් අතුරින් වසභ රජුට පමණක් අදාළ තොරතුරු ඇතුලත් පිළිතුර කුමක්ද?

A. මහවැව් තැනවීම
B. ඉන්දියාවේ පාණ්ඩ්‍ය දේශය ආක්‍රමණය කිරීම
C. නව රාජ්‍යවංශයක් ආරම්භ කිරීම
D. විදේශ ආධිපත්‍යයකින් රට බේරා ගැනිම

1. A හා D
2. B හා C
3. A හා C
4. C හා D

23. පහත 'අ' හා 'ආ' .තීරු දෙක ගැළපෙන ලෙස සකස් කරන්න.

| අ | ආ |
|---|---|
| 1. පළමුවන පරාක්‍රමබාහු රජු | A. බසවක්කුළම වැව |
| 2. පණ්ඩුකාභය රජු | B. පරිපාලනය විධිමත් කිරීම |
| 3. නිශ්ශංකමල්ල රජු | C. බුරුම ආක්‍රමණය |
| 4. මානවම්ම රජු | D. ගල්පොත සෙල්ලිපිය |

1. D C B A
2. B A C D
3. C A D B
4. B D C A

- **පහත සිදුවීම් ඇසුරින් ප්‍රශ්න 24 හා 25 ට පිළිතුරු ලියන්න.**

A. පළමුවන විමලධර්මසූරිය රජු රජවීම
B. හයවන විජයබාහු රජු රජවීම
C. මුල්ලේරියා සටන සිදුවීම
D. සේනාධිසම්මත වික්‍රමබාහු රජවීම

24. ඉහත සිදුවීම් ඓතිහාසික අනුපිළිවෙළට ගැලපූ විට

1. D C AB
2. B A C D
3. D B C A
4. C B D A

25. C අක්ෂරය තුළින් පෙන්වන සටනට සම්බන්ධ වූ මෙරට රජු,

1. I රාජසිංහ රජු
2. II වන රාජසිංහ රජු
3. I විමලධර්මසූරිය රජු
4. අස්ථාන කුමරු

26. මෙරට දෙවන නාගරීකරණයට අයත් රාජධානියක් නොවන්නේ,

1. දඹදෙනිය
2. මාසම
3. කුරුණෑගල
4. යාපහුව

27. කලාකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත උපාධියෙන් පිදුම්ලත් රජතුමා වන්නේ,

1. I පරාක්‍රමබාහු රජු
2. II වන විජයබාහු රජු
3. III වන පරාක්‍රමබාහු රජු
4. IV පරාක්‍රමබාහු රජු

**පහත වගුවේ තොරතුරු ඇසුරින් 28 හා 29 ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

| වර්ෂය | ආණ්ඩුකාරවරු | ඓතිහාසික පුද්ගලයෝ |
|---|---|---|
| A 1795 | D. රොබට් බ්‍රවුන්රිග් | G. ජෝන් ඩොයිලි |
| B. 1803 | E. ෆෙඩ්රික් නෝර්ත් | H. මැක්ඩොවල් |
| C. 1818 | F. ෆන් එංගල් බෙක් | I. පස්වන විලියම් |

28. ශ්‍රී ලංකාවේ ලන්දේසි බලකොටු ඉංග්‍රීසීන්ට පවරා ගැනීමට අදාළ තොරතුරු ඇතුලත් පිළිතුර කුමක්ද?
   1. B D G   2. A F J   3. A E J   4. B F J

29. උඩරට ඉංග්‍රීසීන්ට යටත්වීමට පෙර සිදු වූ සටනක් පිළිබඳව තොරතුරු ඇතුලත් පිළිතුර කුමක්ද?
   1. B E H   2. A D H   3. A F G   4. B D G

30. කුරුණෑගල රාජධානියේ ප්‍රථම පාලකයා කවුද ?
   1. IV වන පරාක්‍රමබාහු රජු   2. II වන බුවනෛකබාහු රජු
   3. V වන පරාක්‍රමබාහු රජු   4. II වන පරාක්‍රමබාහු රජු

31. රෙපරමාදු ව්‍යාපාරය යුරෝපය තුළ ක්‍රියාත්මක වූ රට,
   1. ප්‍රංශය   2. ජර්මනිය   3. රෝමය   4. එංගලන්තය

32. ජොහැන්නස් කෙප්ලර් කුමන ජාතිකයෙක්ද?
   1. ඉතාලි   2. ප්‍රංශ   3. සුවිස්   4. ජර්මන්

33. කාර්මික විප්ලවය සමයේ දුවන නඩාව සොයා ගත්තේ,
   1. ජෝන් කේ   2. රිචඩ් ආර්ක්රයිඩ්   3. සැමුවෙල් ක්‍රොම්ප්ටන්   4. විලියම් සීමන්ස්

34. හම්ප්‍රි ඩේවි විසින් නිපදවන ලද්දේ,
   1. විදුලි උදුන   2. ජල රාමුව   3. ආරක්ෂිත පහන   4. ජෙනී යන්ත්‍රය

35. ගල් අඟුරු කර්මාන්තය තුළ තිබූ ප්‍රධානතම ගැටලුව නම්,
   1. ගල් අඟුරු වහා ගිනි ඇවිලෙන සුළු වීම   2. ජලය සමඟ මිශ්‍ර වී තිබීම
   3. ප්‍රවාහනයේදී අපතේ යාම   4. ගල් අඟුරු කැනීම හා ගොඩට ගැනීමේ අපහසුව

36. කාර්මික විප්ලවය සමයේ බැටළු අභිජනන නව ක්‍රම සොයාගත්තේ,
   1. ජේම්ස් බට්ලර්   2. ජේම්ස් රෝටල්   3. රොබට් බැක්වෙල්   4. සනී සැමුවෙල්

37. කොළඹ - මහනුවර දුම්රිය මාර්ගය ඉදිකිරීම සිදුවන විට මෙරට සිටි ආණ්ඩුකාරවරයා,
   1. රොබට් බ්‍රවුන්රිග්   2. එමසන්ට් ටෙනන්ට්   3. එඩ්වඩ් බාන්ස්   4. රොබට් චාර්මස්

38. ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව ඇතිකළ මුහුදුබඩ කැරැල්ලෙන් පසුව මෙරටට පැමිණි කොමිසම වන්නේ,
   1. මියුරන් කොමිසම   2. කෝල්බෲක් කොමිසම
   3. මොර්ගන් කොමිසම   4. සෝල්බරි කොමිසම

39. ක්‍රි.ව. 1818 උඩරට ප්‍රථම නිදහස් සටනේ නායකයෙකු නොවන්නේ,
   1. කැප්පෙට්ටිපොල   2. ඇහැලේපොළ   3. බූටැවේ රටේ රාළ   4. පුරන් අප්පු

40. කෝල්බෲක් යෝජනා අතරින් ගම්සභාව අඩපනවීමට බලපාන ලද ප්‍රධානතම යෝජනාව කුමක්ද?
   1. ඉංග්‍රීසි අධ්‍යාපනය පුළුල් කිරීමට යෝජනා කිරීම   2. රාජකාරි චතුවගාව අහෝසි කිරීම
   3. මෙරට චතුවගාව ආරම්භ කිරීම   4. උඩරට පහතරට ඒකාබද්ධ කිරීම

සියලුම හිමිකම් ඇවිරිණි / All Right Reserved

# විද්‍යාරත්න විද්‍යායතන පිරිවෙන - හොරණ
## පළමු වාර පරීක්ෂණය - 2022
## 1st Term Test 2022 - August

11 ශ්‍රේණිය | ඉතිහාසය II | කාලය : පැය 3 යි.

- I කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරක් හා III කොටසින් එක් ප්‍රශ්නයක් වන සේ පිළිතුරු සපයන්න.
- ප්‍රථම ප්‍රශ්නය හා II හා III කොටසේ ප්‍රශ්න සමඟ මුළු ප්‍රශ්න පහක් වන සේ පිළිතුරු සැපයිය යුතුයි.

## I කොටස

01. අ. පහත (i) හා (ii) කොටස්වල ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ඔබට සපයා ඇති ලංකාවේ හා ලෝක සිතියම මත සලකුණු කර නම් කරන්න.

i. දඹකොළ පටුන, බූන්දල, පොළොන්නරුව, මල්වතු ඔය, අලිගල, සීතාවක, කෝට්ටේ, මහියංගනය, කුරුණෑගල, කොට්ටියාරම, හුරුළු වැව, මඩකලපුව, (ල. 12)

ii. කැලිකට්, රතු මුහුද, කොන්ස්තන්තිනෝපල්, කළු මුහුද, ජාවා, ජපන් දූපත් (ල. 6)

ආ. i. පහත A, B, C, D යටතේ දක්වා ඇති තොරතුරුවලට අදාළ රජු නම් කරන්න.

A. ලංකාවට ඉංග්‍රීසීන් පැමිණෙන විට උඩරට සිටි රජු
B. ඉංග්‍රීසීන් විසින් උඩරට පාලනයට පත්කළ නියෝජිතයා
C. සීතාවකින් උඩරටට පහර දී යටත් කරනවිට එහි සිටි පාලකයා
D. විජයබා කොල්ලය වන විට කෝට්ටේ සිටි පාලකයා (ල.4)

- පහත A හා B යටතේ දී ඇති පින්තූර ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A රූපය



ii. 1. මෙහි දැක්වෙන්නේ කුමක්ද?
2. මෙය හමු වූ ස්ථානය කුමක්ද?
3. මෙය නිර්මාණය කළ රජු කවුද?
4. මෙහි ඇති විද්‍යාව හඳුන්වන නම කුමක්ද? (ල. 4)

B රූපය



iii. 1. මෙම රූපය කුමක්ද?
2. මෙය නිපදවූයේ කවුද?
3. ඔහු කුමන ජාතිකයෙක් ද?
4. මෙය නිපදවූ වර්ෂය කුමක්ද? (ල. 4 යි)

## II කොටස

02\. i. මෙරට ඉතිහාසය හැදෑරීමට ඇති අභිලේඛන සාධක වර්ග තුනක් ලියන්න. (ල. 3 යි)

ii. අභිලේඛන මූලාශ්‍ර ලෙස භාවිත කිරීමේ වැදගත්කම පිළිබඳ කරුණු දෙකක් ලියන්න. (ල.4 යි)

iii. විදේශ මූලාශ්‍ර ඉතිහාසය හැදෑරීමේදී වැදගත්වන අයුරු කරුණු දෙකකින් පහදන්න. (ල. 5 යි)

iv. ඉතිහාසය ඉගෙනීමේ ප්‍රයෝජන කරුණු තුනකින් විස්තර කරන්න. (ල. 6 යි)

03\. i. මෙරට දේශගුණික කලාප 3 ක් ලියන්න. (ල. 3 යි)

ii. මෙරට ප්‍රාග් ඓතිහාසික ස්ථාන අතුරින් කැණීම් කර ඇති ස්ථාන 4 ක් ලියන්න. (ල. 4 යි)

iii. ප්‍රාග් ඓතිහාසික මානවයාගේ තාක්ෂණය පිළිබඳ' කරුණු දෙකකින් පහදන්න. (ල. 4 යි)

iv. ප්‍රාග් ඓතිහාසික මානවයාගේ අභිචාරවිධි පිළිබඳ කරුණු තුනකින් පහදන්න. (ල. 6 යි)

04\. i. පූර්ව ඓතිහාසික යුගයේ පහත දක්වෙන පුද්ගලයන් හඳුන්වන්න.

A. ගෘහපති B. ගමික C. පරුමක (ල. 3 යි)

ii. දුටුගැමුණු රජුගේ නිරාමිෂ 4 ක් ලියන්න. (ල. 4 යි)

iii. මධ්‍යතන පාලනයක් ඇති කිරීමට පණ්ඩුකාභය රජු ඉටුකළ කාර්යයන් දෙකක් පැහැදිලි කරන්න. (ල. 5 යි)

iv. දුටුගැමුණු රජු බලය මධ්‍යගත කළ අයුරු කරුණු තුනකින් පැහැදිලි කරන්න. (ල. 6 යි)

05\. i. අතීතයේ රජවරු පෙනී සිටි සංකල්ප පහත දී ඇති අතර ඊට අදාළ රජු නම් කරන්න.

A. පර්වතරාජ B. බෝධිසත්ත C. අලකපති රජු (ල. 3 යි)

ii. අතීතයේ රජකම උරුම වූ ප්‍රධාන ක්‍රම දෙක ලියන්න. (ල. 4 යි)

iii. පාලන තන්ත්‍රය තුළ රජුට සහාය වූ නිලධාරීන් පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 5 යි)

iv. දුටුගැමුණු රජු ශ්‍රේෂ්ඨ පාලකයෙකු වන අයුරු කරුණු තුනකින් පැහැදිලි කරන්න. (ල. 6 යි)

06\. i. මහා විජයබාහු රජුගේ බිසවක්, නැගණිය හා උපකාර කළ ප්‍රාදේශීය අධිපතිගේ නම ලියන්න (ල. 3 යි)

ii. පොළොන්නරුව රාජධානියක් මෙන් ම අගනගරයක් ලෙසට තෝරා ගැනීමට බලපෑ කරුරණු දෙකක් පහදන්න. (ල. 4 යි)

iii. පොළොන්නරු රාජධානිය බිඳ වැටීමට හේතු වූ කරුණු දෙකක් විස්තර කරන්න. . (ල. 5 යි)

iv. ලංකාවේ දෙවන නාගරීකරණයට අදාලව ගොඩනැගුණු රාජධානි දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 6 යි)

07\. i. ගම්පොළ රාජධානියේ ආරම්භක රජු හා එකල බලවත්ව සිටි ඇමතිවරු දෙදෙනා නම් කරන්න. (ල. 3 යි)

ii. කෝට්ටේ රාජ්‍යයේ පාලනය මෙහෙයවූ රජවරු 4 ක් නම් කරන්න. (ල. 4 යි)

iii. විජයබා කොල්ලය පිළිබඳව සටහනක් ලියන්න.. (ල. 5 යි)

iv. පෘතුගීසින්ට කෝට්ටේ රාජ්‍ය යටත් කිරීමට වාසිදායන ලෙස බලෑ කරුණු තුනක් පැහැදිලි කරන්න. (ල. 6 යි)

## III කොටස

09.. i. කාර්මික විප්ලවය සිදු වූ ප්‍රධාන ක්ෂෙත්‍ර තුන ලියන්න. (ල. 3 යි)

ii. ඉන් එක් ක්ෂේත්‍රයක නව සොයාගැනීම් 4 කු නම් කරන්න. (ල.4 යි)

iii. කාර්මික විප්ලවය සිදුවීමට බලපෑම් කළ හේතු දෙකක් පැහැදිලි කරන්න. (ල. 5 යි)

iv. කාර්මික විප්ලවය සිදු වූ අනෙකුත් ක්ෂේත්‍ර දෙකක් නම් කර එම ක්ෂේත්‍රවල කාර්මීකරණය සිදු වූ අයුරු පැහැදිලි කරන්න. (ල. 6 යි)

10 i. ඉංග්‍රීසීන් ලංකාව පිළිබඳව උනන්දුවීමට බලපෑම් කළ හේතු තුනක් ලියන්න. (ල. 3 යි)

ii. ඉංග්‍රීසීන් උඩරට අල්ලා ගැනීමට උත්සාහ දැරූ අවස්ථා දෙකක් කෙටියෙන් පහදන්න. (ල.4 යි)

iii. 1818 අරගලයට හේතු වූ ප්‍රධාන කරුණු දෙකක් විස්තර කරන්න. (ල. 5 යි)

iv. 1848 දෙවන නිදහස් අරගලයට බලපෑම් කළ හේතු තුනක් විස්තර කරන්න. (ල. 6 යි)